**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 07 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල සභාවට පරිත්‍යාග ලෙස ලබාදී තිබූ ජල බවුසරයේ වටිනාකම රු.4,684,253 ක් සහ බැකෝ ලෝඩරයේ වටිනාකම රු.954,179 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාලව මෝටර් රථ හා කරත්ත ගිණුමේ සිදුකරන ලද නිවැරදි නොවන ගැලපීම් හේතුවෙන් රු.3,515,000 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ ගිණුමේ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ සභාව සතු ඉතිරිකිරීමේ ගිණුම් දෙකකට අදාලව එකතුව රු.880,526 ක් වටිනා ඉතුරුම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයට අදාල රු.265,875 ක් වූ හිඟ හිටි උසාවි දඩ වටිනාකම නිවැරදි ලෙස ගිණුම්ගත වී නොතිබීමෙන් ද්වීගණනය වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත 11 කට අදාලව කර්මාන්ත ණයහිමි වටිනාකම රු.942,943 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත 4 කට අදාලව කර්මාන්ත ණයගැති වටිනාකම රු.126,611 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටිව තිබූ ණය වාරිකවල ඇතුළත් රු.108,433 ක් වටිනා පොලී වියදම උපචිත පදනම මත ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ වූ රු.287,154 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා ජල කර්මාන්ත ද්‍රව්‍ය ආරම්භක තොගය මූල්‍ය ප්‍රකාශන තුළ වියදමක් ලෙස ගලපා නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂය තුලදී සභාවට ලබාදී තිබූ ගැල්වනයිස් කොඩි කණු 280 ක වටිනාකම වූ රු.276,785 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි ශේෂ තහවුරු කර ගැනීමෙන් තොරව හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට රු.2,050,181 ක් බැර කර තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයට අදාලව රු.1,024,491 ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ දී වැරදි ලෙස ගැලපීම් කර තිබීමෙන් ජංගම වත්කම් සහ සමුච්චිත අරමුදල් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු16,331,449 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර දක්නට ලැබුණු වෙනස්කම්වල එකතුව රු.2,410,396 ක් නිරීක්ෂණය වී තිබුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.14,068,253 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.11,671,283 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

රු.108,602,998 ක් වටිනා ගිණුම් විෂයයන් 07 ක්, අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | සභාවට අයිති හා සභාව විසින් භාවිතා කරන ලද සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්. 46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.880, 2005 මාර්තු 24 දිනැති ඌව පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අංක 2/මු/1 දරන ලිපිය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 180 | සභාවේ සේවයෙහි නියුතු ඇප තැන්පත් තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකු ඇප තැන්පත් කරනොතිබුණි. |
| (ii) මු.රෙ. 371 | සමාලෝචිත වර්ෂයේ විවිධ පාර්ශවයන් වෙත අවස්ථා 16 කදී ගෙවන ලද රු.275,611 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ඇ) රජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ සේවය කර සේවය හැරගිය සේවකයෙකු ගෙන් 2005 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.26,920 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,679,636 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,706,937 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.1,045,417 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් 61% (රු.3,056,271) ක් හිඟ හිටිව තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල අක්කර බදු ගෙවීම් සඳහා ලියාපදිංචි වී තිබූ පුද්ගලයින් 81 දෙනෙකුගෙන් 2015 වර්ෂය අවසානයේ දී රු. 87,172 ක මුදලක් අක්කර බදු හිඟ ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 16 කින් අයවිය යුතු වසර 10 ක පමණ කාලයකට අදාල පැරණි කඩ කුලී හිඟ රු.530,672 ක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ අංක 1523/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු, සභා බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන තේ කර්මාන්ත ශාලා 02 ක් සහ ඇඹරුම්හල් 09 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,005,935 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,750,800 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

සභාව විසින් කාර්යාල උපකරණ මිල කැඳවුම් ලබාගෙන කාර්යාල උපකරණ මිලදී ගැනීමේ දී අවම මිල ලෙස රු.226,950 ක් ඉදිරිපත්ව තිබියදී රු.270,180 කට මිලදී ගැනීම නිසා රු.43,230 ක් වැඩිපුර සභා අරමුදලෙන් ගෙවා තිබුණි.

3.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

(අ) සභාව විසින් 2015 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කරන ලද කර්මාන්ත 03 ක ගිවිසුම් කාලය අවසන්ව තිබුණද, වැඩ ආරම්භ කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබියදී ලබාදී තිබූ රු.410,000ක අත්තිකාරම් මුදල් පියවා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සභාව විසින් කොස්ලන්ද වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් 12% ක වාර්ෂික පොළිය මත රු.5,000,000 ක් හා සභා අරමුලින් රු.1,591,337 ක් වශයෙන් එකතුව රු.6,591,357 ක් වියදම් කර තිබුණද එම වෙළඳ සංකීර්ණයට පිවිසුම් මාර්ගයක් නොමැති බැවින් කඩ කාමර 10 ක් කුලියට ලබාදීමට නොහැකිවී තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **නිශ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

2015 ජූලි 02 වන දින සභාව වෙත පවරා දී තිබූ බැකෝ ලෝඩර් යන්ත්‍රය, 2004 වර්ෂයේ දී ලැබී තිබූ ජෝන් ඩියර් ට්‍රැක්ටරය සමඟ නඟුල සහ අංක 252-6369 දරන කැබ් රථය කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් උපයා ගැනීමට නොයොදා සභා භූමිය තුළ සහ ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) ණයගැති සහ ණයහිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය